ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
වයඹ පළාතේ පළාත් සභාව

# වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 03 දරන බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

(අනුමත කළ දිනය : 1992.06.08)

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**1992 ජුලි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV අ කොටසේ පළකරන ලදී**

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිළදී ගත හැක.

මිළ: රු. 5.00 තැපැල් ගාස්තුව: රු: 2.00

වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 03 දරන බස්රථ මගින්

මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

වයඹ පළාත තුළ මුලාරම්භය ඇත්තා වූ හෝ නිමාවන්නා වූ හෝ මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම පිණිසත්, එම සේවා බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා පළාතේ පළාත් සභාවට හැකිවනු පිණිසත්, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්, 1990 අංක 3 දරන මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය ඉවත් කිරීම පිණිසත් වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 03 දරන බස්රථ මගින් මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේ ය. — සංක්ෂිප්ත නාමය හා ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### පරිපාලනය අධ්‍යක්ෂවරයා සහ උපදේශක කමිටුව

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා (මෙහි මින්මතු 'අධ්‍යක්ෂවරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන වයඹ පළාතේ පළාත් ප්‍රවාහන අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තියෙහි සාමාන්‍ය පරිපාලනය ඔහුට භාර වන්නේය. තවද, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වන පළාත් බස්රථ ප්‍රවාහන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය. — ප්‍රඥප්තිය පරිපාලනය කිරීම.

(2) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් තත් කාර්ය සඳහා අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිත ලියවිල්ලකින් බලය පවරනු ලැබූ, යම් පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු විසින් හෝ වෙනත් නිලධාරියකු විසින් හෝ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකිය.

(3) 1990 අංක 3 දරන මාර්ගස්ථ මගින් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තියෙහි අංක 2 (1) ඡේදය යටතේ කරන ලද සියළුම පත් කිරීම් මෙම ප්‍රඥප්තියෙහි ඉහත (1) වන උප ඡේදය යටතේ කරන ලද පත් කිරීමක් වන අතර, එම පත් කිරීම කරන ලද දින සිට වලංගු වේ. — මගී ප්‍රවාහන උපදේශක කමිටු.

3. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම සඳහා අදාල අමාත්‍යවරයා විසින් මෙම වගන්තියේ 2 වන උප වගන්තියට අනුකූලව නම් කරනු ලබන පුද්ගලයන් හත් දෙනෙකුගෙන් සමන්විත (''මින්මතු උපදේශක කමිටුව'' නමින් හඳුන්වනු ලබන) වයඹ පළාතේ මගී ප්‍රවාහන උපදේශක කමිටුවක් පත් කළ හැකි වන්නේය.

(2) එම උපදේශක කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යි.

(අ) අදාළ අමාත්‍යාංශයේ ලේකම්.

(ආ) ප්‍රධාන අමාත්‍යවරයාගේ නියෝජිතයෙක්.

(ඇ) අමාත්‍යවරය ගේ ප්‍රසාදය පරිදි පත් කරන පෞද්ගලික අංශයේ මගී සේවා අවසර පත්‍රලාභි ප්‍රවාහන ක්ෂේත්‍රයේ පළපුරුදු අයෙක්.

(ඈ) වයඹ පළාතේ ප්‍රධාන ලේකම්ගේ නියෝජිතයෙක්.

(ඉ) වයඹ පළාතේ නියෝජ්‍ය පොලිස්පතිගේ නියෝජිතයෙක්.

(ඊ) ප්‍රවාහන සේවක මණ්ඩලය වෙනුවෙන් පත්කරනු ලබන නියෝජිතයෙක්

(උ) බස් මගීන් වෙනුවෙන් පත්කරන ලද නියෝජිතයෙක්.

(3) උපදේශක කමිටුවේ සභාපතිවරයා අදාළ අමාත්‍යාංශයේ ලේකම් වන අතර, ඔහු කමිටුවේ සියළුම නිර්දේශයන් ලිඛිතව අධ්‍යක්ෂවරයාට දැනුම් දීමට බැඳී සිටින්නේ ය.

(4) තනතුර අතහැරියොත් හෝ ඉල්ලා අස්වුවහොත් හෝ මියගියහොත් හෝ අදාල අමාත්‍යවරයා විසින් කලින් අවසන් කරනු ලැබුවහොත් හෝ මිස උපදේශක කමිටුවේ සාමාජිකයන්ගේ ධූර කාලය අවුරුදු 2 කි. කාලයාගේ ඇවෑමෙන් තනතුරෙන් ඉවත් වන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබිය හැකිය.

(5) උපදේශක කමිටුවේ කාර්ය පරිපාටිය මෙම ප්‍රඥප්තියේ 22 (6) යටතේ අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග මගින් ප්‍රතිෂ්ඨාපනය කළ හැක.

## II වන කොටස

### බලයලත් නැනැත්තා, මගී සේවා අවසර පත්‍ර සහ අභියාචනා

බලයලත් නැනැත්තා.

4. (1) වයඹ පළාත ඇතුලත වෙන් වෙන් ගාස්තු මත මගීන් ගෙන යාම සඳහා බස්රථයක් පාවිච්චි කිරීමට බලය දෙන මගී සේවා අවසර පත්‍රයක් හෝ ඒ හා සමාන බලපත්‍රයක් නිකුත් කිරීමට බලයලත් නැනැත්තා අධ්‍යක්ෂවරයා වන්නේ ය.

මගී සේවා අවසර පත්‍ර.

(2) මේ ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ හෝ ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් දෙන ලද මගී සේවා අවසර පත්‍රයක බලය යටතේ හෝ හැර මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන්පසුව, කිසිම නැනැත්තකු විසින් වෙන් වෙන් ගාස්තු මත මගීන් ගෙන යාම සඳහා පළාත ඇතුලත ආරම්භ වන නිත්‍යපත සේවය සඳහා බස්රථ පළාත ඇතුලත යොදා නොගත යුතුය.

සාමාන්‍ය බස් රථ මගින් මගීන් ගෙනයාම.

5. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන මගී සේවා අවසර පත්‍රයකින් ඒ අවසර පත්‍රයේ සඳහන් මාර්ගයේ හෝ මාර්ගවල වෙන් වෙන් ගාස්තු මත මගීන් ගෙනයාම සඳහා සේවයක් පවත්වාගෙන යාම පිණිස ඒ අවසර පත්‍රය දරන්නා ලියාපදිංචි අයිතිකරු වන බස්රථයක්, යොදා ගැනීමට ඒ අවසර පත්‍රය දරන්නාට අයිතිවාසිකම ලැබෙන්නේ ය.

මගී සේවා අවසර පත්‍ර සඳහා ඉල්ලුම් කිරීම.

6. (1) මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියක් අනුව විය යුතු අතර, එය බස් රථයේ ලියාපදිංචි අයිතිකරු විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) මගී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තෙකුම විසින් (1) වන උප වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන තම ඉල්ලුම් පත්‍රය සමග, පහත දැක්වෙන විස්තර අඩංගු නියමිත ආකෘතිය අනුව වූ ප්‍රකාශයක්ද ඉදිරිපත් කළ යුතු ය. එනම් :—

(අ) වෙන් වෙන් ගාස්තු මත, මගීන් ගෙන යාම සඳහා ඒ බස්රථ යොදා ගැනීමට අදහස් කරනු ලබන මාර්ගය හෝ මාර්ග පිළිබඳ විස්තර.සහ

(ආ) ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ සහ උපදේශක කමිටුවේ නිර්දේශයන් මත අධ්‍යක්ෂවරයා ඉල්ලා සිටින වෙනත් විස්තර,

අවසර පත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම.

7. මගී සේවා අවසර පත්‍රයක් දීම සම්බන්ධයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් හෝ එවැනි අවසර පත්‍රයක් අලුත් කිරීම සම්බන්ධයෙන් සහ අවසර පත්‍ර දෙනු ලැබිය හැක්කේ යම් මාර්ගයක් හෝ මාර්ග සඳහා ද, ඒ මාර්ග සම්බන්ධයෙන් තම බලය ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂවරයා විසින් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ හා උපදේශක කමිටුවේ නිර්දේශයන් අනුව ක්‍රියා කළ යුතු වන අතර, පහත දැක්වෙන කරුණු ගැනද සැලකිලිමත් විය යුතුය.—

(අ) පොදු යහපත පිණිස කොතෙක් දුරට යොජිත පරිදි මගීන් ගෙන යාම අවශ්‍ය ද, යෝග්‍ය ද, යන වග :

(ආ) යෝජිත මාර්ගයේ හෝ මාර්ග වල යෝග්‍යතාව ;

(ඇ) යෝජිත මාර්ගයේ හෝ මාර්ග වල හෝ ඉන් යම් මාර්ගයක දැනටමත් කොතෙක් දුරට ප්‍රමාණවත් ලෙස, මගීන් ගෙනයාමේ සේවයක් සලසා තිබේද යන වග ;

(ඈ) ප්‍රමාණවත්, යෝග්‍ය සහ කාර්යක්ෂම සේවාවන් සැපයීමද රථ වාහන වලට අදාලව, සමස්ථයක් වශයෙන් ප්‍රදේශයේ අවශ්‍යතා සහ දුම්රිය මගීන් ප්‍රවාහනය කිරීමද ඇතුළුව, සියලුම ආකාරයෙන් මගීන් ප්‍රවාහනය කිරීම සම්බන්ධීකරණය කිරීම.

මගී සේවා අවසර පත්‍ර වලංගු කාල සීමාව.

8. (1) යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව හෝ ගාස්තු අධ්‍යක්ෂවරයා වෙත ගෙවනු ලැබුවහොත් හැර, අධ්‍යක්ෂවරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ ඒ තැනැත්තාට මගී සේවා අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(2) සෑම මගී වාහන අවසර පත්‍රයක්ම—

(අ) නියමිත ආකෘතිය අනුව විය යුතුය ; තවද,

(ආ) එය කලින් අවලංගු කරනු ලැබුවහොත් හැර, එය නිකුත් කරන ලද දින සිට මාස දොළහේ සිට මාස තිස් හයක් වූ කාල සීමාවක් වලංගුව පවතින්නේය.

2—සී8 20342 (94/02)

අවසර පත්‍රයේ අතුළුක්ත කළ යුතු කොන්දේසි.

9. මේ ප්‍රඥප්තියේ විධි විධාන වලට සහ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග වලට අනුකූලව මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම මගී සේවා අවසර පත්‍රයකම මහජනතාවගේ ආරක්ෂාව සහ පහසුව සැලසීම පිණිස අධ්‍යක්ෂවරයා විසින් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ සහ උපදේශක කමිටුවේ නිර්දේශයන් මත තීරණය කරනු ලබන කොන්දේසි ඇතුලත් කරනු ලැබිය යුතුය. ඒ කොන්දේසි වලට—

(අ) අය කරනු ලබන ගමන් ගාස්තු මගී සේවා අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ සඳහන් වන ගාස්තු විය යුතු බවට ;

(ආ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස්රථය අවසර පත්‍රයේ සඳහන් වන මාර්ගයෙහි හෝ මාර්ග වල ධාවනය කළ යුතු බවට;

(ඇ) නියම කර ඇති විට කාල සටහනෙහි සහ ගමන් ගාස්තු වක්‍රයෙහි පිටපත් අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථයේ රැගෙන යා යුතු බවට සහ එහි තුළ ප්‍රදර්ශනය වන ලෙස තැබිය යුතු බවට ;

(ඈ) අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස් රථය සියලු අවස්ථාවන්හිදී සුදුසු හා සේවය කළ හැකි තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු බවට ;

(ඉ) බස්රථ වල රියැදුරන්ගේ හෝ කොන්දොස්තරවරුන් අඛණ්ඩව කාර්යයෙහි නිරත වන කාලය සහ ඔවුන්ගේ වැඩ කරන සහ විවේක කාලය සහ ඔවුන්ගේ වේතන සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක නියමයන් අවසර පත්‍රයේ බලය යටතේ යොදා ගනු ලබන බස්රථයේ රියැදුරු සහ කොන්දොස්තර සම්බන්ධයෙන් පිළිපදිනු ලැබිය යුතු බවට

නියම කෙරෙන කොන්දේසි ද ඇතුලත් කළ හැකිය.

අවසර දෙනු ලැබූ බස් රථයේ විස්තර අවසර පත්‍රවල දැක්වීම.

10. අධ්‍යක්ෂවරයා විසින් මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් දෙනු ලබන අවස්ථාවේදී ඒ අවසර පත්‍රය මගින් පාවිච්චි කිරීම සඳහා බලය දෙනු ලබන බස්රථය, එහි හඳුනා ගැනීමේ අංකය සහ අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන වෙනත් විස්තර ඒ අවසර පත්‍රයේ සඳහන් කිරීමෙන් නිශ්චිතව දන්වනු ලැබිය යුතුය.

විධාන නිකුත් කිරීමට අධ්‍යක්ෂවරයාට ඇති බලය.

11. මේ ප්‍රඥප්තිය යටතේ මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබූ ඕනෑම තැනැත්තෙකු මේ ප්‍රඥප්තියේ විධි විධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝග පිළිපදින බවට වග බලා ගැනීම පිණිස 9 වන වගන්තියට අනුකූලව අධ්‍යක්ෂවරයා විසින් යම් විධාන ඒ තැනැත්තාට නිකුත් කළ හැකි අතර, ඒ විධාන නිකුත් කරනු ලැබූ තැනැත්තා විසින් ඒ විධාන වල සඳහන් වන කාලය ඇතුලත ඒ විධි විධාන පිළිපැදිය යුතුය.

අවසර පත්‍ර පැවරිය නොහැකි බව.

12. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් යම් තැනැත්තෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර, ඒ අනුව එවැනි යම් පැවරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේය.

13. මගී සේවා අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි අවසර පත්‍රය දරන්නා විසින් සඳහන් කරන ලද විස්තර වල යම් වෙනසක් සිදු වූ දින සිට දින 30 ක් ඇතුලත, ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඒ පිළිබඳව ලියවිල්ලකින් අධ්‍යක්ෂවරයාට දැනුම් දී ,ඔහුගේ එකඟත්වය ලියවිල්ලකින් ලබා ගත යුතුය. අවසර පත්‍ර දරන්නන් විසින් විස්තර වල යම් වෙනසක් පිළිබඳව අධ්‍යක්ෂවරයාට දන්විය යුතු බව.

14. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට— අවසර පත්‍රය අලුත් කිරීම.

(අ) ඒ මගී සේවා අවසර පත්‍රය දරන්නා මේ ප්‍රඥප්තියේ විධි විධාන අනුව ක්‍රියා කර ඇති බවට හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ යම් වරදක් කර නොමැති බවට, සහ

(ආ) මගී සේවා අවසර පත්‍රය දරන්නා අවසර පත්‍රය අළුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවා ඇති බවට

අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වුවහොත් ඔහු විසින් ඒ අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වන දින සිට එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා ඒ අවසර පත්‍රය අළුත් කළ හැකිය.

15. මගී වාහන අවසර පත්‍රය දරන්නා— අවසර පත්‍රයක් අවලංගු කිරීම.

(අ) මේ ප්‍රඥප්තියේ යම් විධි විධානයක් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධි විධානයක් හෝ උල්ලංඝණය කර ඇති බවට:

(ආ) 11 වන වගන්තිය යටතේ ඔහුට නිකුත් කර ඇති යම් විධානයක් පිළිපැද නොමැති බවට; හෝ

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් යවනු ලැබූ යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක හෝ යම් ලිඛිත තොරතුරු වල හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඔහු දැනුවත්ව ව්‍යාජ හෝ වැරදි විස්තර සපයා ඇති බවට; හෝ

(ඈ) අවසර පත්‍රයේ සඳහන් යම් කොන්දේසියක් කඩ කර ඇති බවට හෝ

අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වුවහොත් අධ්‍යක්ෂවරයා විසින් ඒ මගී සේවා අවසර පත්‍රය අවලංගු කළ හැකිය.

16. අධ්‍යක්ෂවරයා විසින් තම මගී සේවා අවසර පත්‍රයක් දීම හෝ අළුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් අවසර පත්‍රයක් අවලංගු කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය හා එයට හේතු අවස්ථාවෝචිතපරිදි ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අධ්‍යක්ෂවරයා විසින් තම තීරණය සහ එයට හේතු ඉල්ලුම්කරුට හෝ අවසර පත්‍රය දරන්නාට දනුම් දිය යුතු බව.

අභියාචනය.

17. (1) (අ) මඟී සේවා අවසරපත්‍රයක් දීම හෝ එය අළුත් කිරීම ප්‍රතික්ෂේප කරමින්, හෝ

(ආ) දී ඇති අවසර පත්‍රය අවලංගු කරමින් හෝ අත්හිටුවමින් අධ්‍යක්ෂවරයා විසින් ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් මඟී සේවා අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ ඉල්ලුම්කරු හෝ මඟී සේවා අවසර පත්‍රයක් දරන්නා විසින් තමාට ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව ජාතික ගමනා ගමන කොමිෂන් සභාව වෙත අභියාචනය කරනු ලැබිය හැකිය.

(2) මෙහි (1) වන උප වගන්තිය යටතේ යම් අභියාචනයක් ඉදිරිපත් කරන ලද විට ජාතික ගමනා ගමන කොමිෂන් සභාව විසින්—

(අ) අභියාචනයට ඉඩ දී අවසර පත්‍රය දෙන ලෙස හෝ අළුත් කරන ලෙස අධ්‍යක්ෂවරයාට විධාන කිරීම, හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකිය.

(3) මෙහි (2) වන උප වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ ඕනෑම විධානයක් අධ්‍යක්ෂවරයා විසින් පිළිපැදිය යුතුය.

සහතිකය වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කළ යුතු බව.

18. මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම මඟී සේවා අවසර පත්‍රයක් දරන්නකු වෙතට ඒ අවසර පත්‍රයේ අධිකාරය යටතේ පාවිච්චි කරනු ලබන එක් එක් බස් රථය සම්බන්ධයෙන් සහතිකයක් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතුය. ඒ අවසර පත්‍රය දරන්නා විසින් ඒ එක් එක් සහතිකය, ඒ සහතිකය අදාළ වන බස් රථයට ඇතුළු වන යම් තැනැත්තෙකුට පැහැදිලිව පෙනෙන ආකාරයෙන් ඒ බස් රථයේ වින්ඩ්ස්ක්‍රීනයේ ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතුය.

19. මේ ප්‍රඥප්තිය යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ සහ තම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සඳහා අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වන යම් වාර වාර්තාවක්, තොරතුරක් හෝ කරුණු පැහැදිලි කිරීම් දන්වීමේ සඳහන් කරනු ලබන කාලය ඇතුළත සපයන ලෙස මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මඟී සේවා අවසර පත්‍රයක් දරන්නෙකුට අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ලකින් දැන්වීමක් දිය හැකි අතර ඒ දැන්වීමේ නියමයන් පිළිපැදීම ඒ අවසර පත්‍රය දරන්නාගේ යුතුකම වන්නේය.

බස්රථයක් නොවන වෙනත් වාහනයක් මඟී ප්‍රවාහනය සඳහා යොදා නොගත යුතු බව.

20. කිසිම තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය බලාත්මක වන දින හෝ ඉන් පසුව, වෙන් වෙන් ගාස්තු මත පාරවල් ඔස්සේ මඟීන් ගෙන යාම සඳ බස් රථයක් නොවන වෙනත් වාහනයක් යොදා නොගත යුතුය.

## III වන කොටස

### අමාත්‍යවරයාගේ බලතල, සේවා ගාස්තු, වරදවල් හා දණ්ඩන

අමාත්‍යවරයාගේ බලතල.

21. අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ මේ ප්‍රඥප්තියේ කර්තව්‍යය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වූ සාමාන්‍ය විධාන අධ්‍යක්ෂවරයා වෙත දෙනු ලැබිය හැකි අතර, ඒ විධාන ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

## මගී ප්‍රවාහනය කිරීම පිළිබඳ ප්‍රඥප්තිය

නියෝග

22. (1) නියමිත කරුණු ලෙස මේ ප්‍රඥප්තියෙන් නියම කර ඇති හෝ නියෝග සෑදීමට මේ ප්‍රඥප්තියෙන් බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) විශේෂයෙන්ම සහ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දක්වෙන සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකිය:

(අ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රැගෙන යා යුතු පුවරු සහ සළකුණු,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක රියදුරු හෝ කොන්දොස්තර විසින් රැගෙන යා යුතු ලේඛන හා ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර,

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථයක් එසේ යොදා ගන්නා යම් තැනැත්තෙකු විසින් පිළිපැදිය යුතු සම්මතයන් සහ ඒ සම්මතයන් උල්ලංඝණය වන ක්‍රියා සහ ආකෘතියක් තහනම් කිරීම,

(ඈ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍රයක බලය යටතේ යොදා ගනු ලබන බස් රථවල ගමන් සම්බන්ධයෙන් තබා ගත යුතු වාර්තා

(ඉ) මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී වාහන අවසර පත්‍ර දරන්නන් විසින් ඒ අවසර පත්‍ර වල බලය යටතේ යොදගනු ලබන බස්රථ වල රියදුරන් හෝ කොන්දොස්තරවරුන් ලෙස සේවා නියුක්ත කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් සහ ඒ තැනැත්තන් සේවය ආරම්භ කරන සහ අවසාන කරන වේලාවන් සහ ඔවුන් විසින් ගනු ලබන විවේක කාලයන් සම්බන්ධයෙන් ඒ අවසර පත්‍ර දරන්නන් විසින් තබා ගත යුතු වාර්තා,

(ඊ) මේ ප්‍රඥප්තිය යටතේ තබා ගනු ලබන වාර්තා සුරැකිව තබා ගැනීම, නියෝග වල සඳහන් යම් බලධරයකු විසින් ඒ වාර්තා පරීක්ෂා කිරීම හා ඒ බලධරයා විසින් ඉල්ලා සිටින ලද විට ඒ වාර්තා එසේ පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කිරීම,

(උ) දිස්ත්‍රික් සංගම් වල හා ඒකාබද්ධ මහා සංගම් වල සහ වෙනත් සංගම් වල කටයුතු පවත්වා ගෙන යාමේ ක්‍රියා පටිපාටිය සහ ඒවායේ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ ක්‍රියා පටිපාටිය

(ඌ) විශේෂයෙන්ම බස් ධාවන වේලාවන් සංවිධානය කිරීම, වේලාවන් කැබීම සහ පහසුකම් නිසි පරිදි සහ සාධාරණ ලෙස යෙදවීම සඳහා බස් නැවතුම්පලවල්, බස් නවත්වන ස්ථාන සංවිධාන කිරීම හා කළමනාකරණය කිරීම

(එ) කොන්දොස්තරවරුන්ට බලපත්‍ර දීම,

(ඒ) මගී සේවා අවසර පත්‍ර ලාභීන්ට සේවා ගාස්තු මත සැපයිය යුතු සේවාවන් නියම කිරීමක් සහ එකී සේවාවන් සඳහා අය කළ යුතු ගාස්තු ප්‍රමාණවල් උපදේශක කමිටුව විමසා නියම කිරීමත්,

(ඔ) මෙම ප්‍රඥප්තියේ විධි විධාන මගින් හෝ ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් නියම කරන කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි කාර්ය මණ්ඩලයක් හෝ නිලධාරීන් සංඛ්‍යාවක් පත් කර ගැනීම.

(3) මෙහි (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනක හෝ එය ක්‍රියාත්මක වන්නේය.

(4) මෙහි (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකුට ඉන් හානියක් නොමැතිව, එකී අනුමැතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

(6) උපදේශක කමිටුවේ කාර්යය පරිපාටිය විධිමත් කිරීමේ නියෝග පැනවිය හැකිය.

සේවා ගාස්තු

23. මෙම ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේදී සැපයිය යුතු යම් සේවාවක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ගාස්තුවක් වශයෙන් වන, අමාත්‍යවරයා විසින් 22 (2) (ඒ) උප වගන්තිය යටතේ නියම කරන සේවා ගාස්තුවක් අධ්‍යක්ෂවරයා විසින් මගී සේවා අවසරපත් ලාභීන්ගෙන් අය කරනු ලැබිය හැකි අතර එසේ සේවා ගාස්තු නොගෙවන මගී සේවා අවසරපත් ලාභීන්ට එකී සේවාවන් ලබා ගැනීමට හිමි කමක් නොතිබිය යුතුය.

එසේ වුවද මගී සේවා අවසරපත් ලාභීන්ගේ එකී අවසර පත්‍රය මත වූ අයිතිවාසිකම් වලට කිසිදු අගතියක්, සේවා ගාස්තු නොගෙවීම මත සිදු නොවිය යුතුය.

පොදු බස් නැවතුම් පොලවල්.

24. බස්රථ නැවැත්වීම සඳහා පළාත් පාලන ආයතන විසින් වයඹ පළාත ඇතුළත පොදු බස් නැවතුම් පොලවල් සහ බස් නවත්වන ස්ථාන ඒ ඒ බල ප්‍රදේශයන් තුළ එකක් හෝ ඊට වැඩි ගණනක් සැපයිය හැකි වන අතර, ඒවා අදාළ අමාත්‍යවරයාගේ පාලනයට යටත් වන අතර, සේවා ගාස්තුවකට ද යටත්විය හැකිය.

වරදවල්.

25. මේ ප්‍රඥප්තියේ යම් විධි විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධි විධානයක් උල්ලංඝණය කරමින් හෝ කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් හෝ තමා දැනුවත්ව ව්‍යාජ ලෙස හෝ වැරදි සහගත ලෙස සඳහන් කරනු ලබන විස්තර ඇතුළත් යම් වාර්තාවක වාර වාර්තාවක්, ලිඛිත තොරතුරක් හෝ ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙක් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන්නේය.

26. මෙ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක්ම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක්දහස් පන්සීයකට නොවැඩි දඩයක් හෝ අවුරුදු දෙකක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඩුවම් දෙකටම හෝ යටත් වන්නේය. දණ්ඩන.

27. මෙ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක— පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වරදවල් සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන් යටත් වන බව.

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේදී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකුම, සාමාන්‍යාධිකාරිවරයෙකුම, ලේකම් වරයෙකුම හෝ ඊට සමාන වෙනත් නිලධරයකුම සිටි සෑම තැනැත්තකුම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, වරද සිදු කරනු ලැබූ වේලාවේදී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකුව සිටි සෑම තැනැත්තකුම වරද සිදු කරනු ලැබුවේ ඔහුගේ දැනුම හෝ අපසහාය කත්වය නොමැති බව සහ ස්වකීය කර්තව්‍ය වල ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු සැළකිල්ලට ගෙන වරද සිදු කිරීම වැලැක්වීම සඳහා ඔහු විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ නිසි සියළු උද්යෝගය ඔහු ක්‍රියාත්මක කළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු ලෙස සළකනු ලැබිය යුතුය.

## IV වන කොටස

### අන්තර් කාලීන විධි විධාන

28. පළාත ඇතුළත ආරම්භ වන මාර්ගයක් සම්බන්ධයෙන් 1990 අංක 3 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර සහ බස්රථ ධාවකයින් විසින් දැනට දරනු ලබන මාර්ග අවසර පත්‍ර මෙ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලැබුවේ යම් කාල සීමාවකටද, ඒ කාල සීමාව සහ මෙ ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට හය මාසයක් වූ කාල සීමාව යන දෙකෙන් අඩු කාල සීමාවක් සඳහා ඒ අවසර පත්‍රය වලංගු වන්නේය. මෙ වන විට නිකුත් කර ඇති මගී සේවා අවසර පත්‍ර.

29. මෙම ප්‍රඥප්තියේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය විය හැකි යම් කාර්ය මණ්ඩලයක් ස්ථිර වශයෙන් පත්කර ගන්නා තුරු අදළ ඇමතිවරයා විසින් 22 (2) ඔ උප වගන්තියට අදළව අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා තාවකාලික කාර්ය මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකිය. අන්තර් කාලීන කාර්ය මණ්ඩලය.

30. මෙ ප්‍රඥප්තියේ 2 (31) සහ 28 වගන්ති වලට හානියක් නොමැතිව වයඹ පළාත් සභාවේ 1990 අංක 3 දරන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය ඉවත් කිරීම.